**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 26/95**

මගේ අංකය:- IV/2/9/243 (එච්) IV- 11
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත
හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

1995.08.04

සියලුම ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් වෙත.

**උප්පැන්න සහතික වෙනුවට රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවෙන්**
**නිකුත් කරනු ලබන වෙනත් සහතික භාරගැනීම**

පුද්ගලයින්ගේ නම් සහ උපන්දින සනාථ කිරීම පිණිස රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන පහත සඳහන් සහතික අතුරින් ඕනෑම සහතිකයක් භාරගත හැකියයි තීරණය කරනු ලැබ ඇත.

(අ) උපත ලියාපදිංචි කරන ලද රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරනු ලැබූ උප්පැන්න ලියාපදිංචි කිරීමේ ලේඛණයේ නොමිලයේ නිකුත් කරන ලද පිටපත. (ලියාපදිංචි කිරීම ආ 1 ආකෘතිය)

(ආ) උප්පැන්න ලේඛණයේ උපුටාගත් සටහන (ලියාපදිංචි කිරීම ආ 65 ආකෘතිය)

(ඇ) අනුමාන වයස් සහතිකය (ලියාපදිංචි කිරීම ආ 142 ආකෘතිය)

(ඉ) උප්පැන්න ලේඛණයේ සහතික කරන ලද ඡායා පිටපත.

කෙසේ වෙතත්, ඉදිරිපත් කරන ලද මෙවැනි සහතිකයක් ගැන යම් සැකයක් ඇතිවුවහොත්, එය රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත යවා පරීක්ෂා කරගත යුතුය.

අ.කලේ/(**ආර්.එස්.ජයරත්න**)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය